උපවාසය, සලාතය සහ දානයට වඩා උතුම් දේ මම ඔබට දැනුම් දෙන්න ද?

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ අද්-දර්
දා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර් තා කරන ලදී. "උපවාසය, සලාතය සහ දානයට
වඩා උතුම් දේ මම ඔබට දැනුම් දෙන්න ද?" ඔවුහු: "එසේය" යැයි පැවසූවෝය. එතුමාණෝ : "එකිනෙකා අතර සාමය ඇති කිරීමය. මක්නිසාද යත් එකිනෙකා අතර පවතින සබඳතා පළුඳු කිරීම සැබවින්ම හාලිකා (විනාශය) වේ." යැයි පැවසුහ. [صحيح] [رواه أبو داود والترمذي]

"අමතර උපවාසය, සලාතය සහ දානයට වඩා උතුම් දේ මම ඔබට දැනුම් දෙන්න ද?" යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ විමසූහ. ඔවුහු: "එසේය" යැයි පැවසූහ. එතුමාණන් මෙසේ පැවසීය: මිනිසුන් අතර ගැටුම්, බෙදීම්, විරසකවීම්, වෛරය සහ දේරා්හිකම් ඇති කරන ආරවුල් පවතින්නේ නම්, එවන් පාර් ශවයන් අතර සංහිඳියාව ඇති කිරීම ය. මන්ද ඔවුන් අතර සබඳතා දූෂිත වීමෙන් ඇතිවන වෛරය දැලි පිහියෙන් රෝම ඉවත් කරන්නාක් සේ ආගම සහ ලෝකය විනාශ කර මුලිනුපුටා දැමිය හැකි කරුණකි.

https://sunnah.global/hadeeth/si/show/66252